සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ඉන්දීය ඉතිහාසය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ප්‍රතිචාර 5 බැගින් දී තිබුණද නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එය තෝරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- කොටස් දෙකටම මුළු කාලය පැය 3 කි.

---

- අංක 01 සිට 10 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

(01) (1) හින්දුකුස් (2) කරකෝරම් (3) සුලෙයිමාන් (4) නිල්ගිරි (5) තිර්ථාර් (........)

(02) (1) කෝසල (2) මගධ (3) කාසි (4) වත්ස (5) අවන්ති (........)

(03) (1) චන්හුදාරෝ (2) හරප්පා (3) මොහොන්ජෝදාරෝ (4) කොට්ඩිජි (5) සුප්පාරක (........)

(04) (1) විෂ්ණු පුරාණ (2) මත්ස්‍ය පුරාණ (3) වායු පුරාණ (4) පෙරිය පුරාණම් (5) ස්කන්ධ පුරාණ (........)

(05) (1) අස්මක (2) ලිච්ඡවී (3) අවන්ති (4) ගන්ධාර (5) කාම්බෝජ (........)

(06) (1) මහායෝගි (2) ශිව (3) බ්‍රහ්ම (4) යෝගීෂ්වර (5) පශුපති (........)

(07) (1) බ්‍රාහ්මණ (2) උපනිෂද් (3) ආරණ්‍යක (4) චතුර්වේද (5) පුරාණ (........)

(08) (1) භාරත වර්ෂ (2) භාරත දේශ (3) හින්දුස්ථාන් (4) ජම්බුද්වීප (5) සප්ත සින්දු (........)

(09) (1) යදු (2) පුරු (3) අනු (4) පුලින්ද (5) තුර්වාස (........)

(10) (1) ඉන්දු ග්‍රීක (2) සක (3) පාර්තියන් (4) කුෂාණ (5) ශුංග (........)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල 5 බැගින් දී ඇත. ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.

(11) (1) මගධය බිම්බිසාර (2) අංග සිසුනාග (3) කෝසල ප්‍රසේනජිත් (4) උජ්ජේනි චණ්ඩපජ්ජෝත (5) කාසි බ්‍රහ්ම දත්ත (........)

(12) (1) බිම්බිසාර හර්යංක (2) කුණාල මෞර්ය (3) ධනනන්ද නන්ද (4) කාලාශෝක සිසුනාග (5) පුෂ්‍ය මිත්‍ර කාන්ව (........)

(13) (1) කෝලිය රාමගාම (2) මෝරිය සරස්වතී
(3) ලිච්ඡවී වෛසාලි (4) විදේහ මිථිලා
(5) මල්ල කුසිනාරා (........)

(14) (1) මක්ඛලී ගෝසාල ජෛන (2) බුද්ධඝෝෂ ථේරවාද
(3) නාගර්ජුණ මහායාන (4) අසංග යෝගාචර
(5) සංකරර් අද්වයික වේදන්ත (........)

(15) (1) බිම්බිසාර රජු කෝසල දේවි (2) අශෝක රජු වීදිසා දේවි
(3) කෝසල රජු මල්ලිකා දේවි (4) චන්ද්‍රගුප්ත රජු ලිච්ඡවී කුමාර දේවි
(5) I කණිෂ්ක රජු දත්තා දේවි (........)

- **අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. X තීරුව Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

(16)

| | X | | Y |
|---|---|---|---|
| (i) | සින්දු | A | මාල්වා උස්බිම |
| (ii) | කෘෂ්ණා | B | හිමාලය |
| (iii) | චම්බාල් | C | ඩෙකාන් සානුව |
| (iv) | බ්‍රහ්මපුත්‍ර | D | බටහිර සාට්ස් |
| (v) | මහානදී | E | ටිබෙට් |

(1) ADCBE (2) BDAEC (3) CAEDB (4) DBAEC (5) BCEAD (........)

(17)

| | X | | Y |
|---|---|---|---|
| (i) | ශ්‍රැති | A | වේදය |
| (ii) | සෝම | B | වැන්දඹු බිරිඳ මියගිය සැමියාගේ දර සෑයට පැන මිය යාමේ චාරිත්‍රය |
| (iii) | සභා | C | වැඩිහිටියන්ගේ රැස්වීම. |
| (iv) | සති | D | මත්පැන් වර්ගයක් |
| (v) | පණි | E | අනාර්ය ගෝත්‍රයක් |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (........)

(18)

| | X | | Y |
|---|---|---|---|
| (i) | දණ්ඩින් | A | සාකුන්තලය |
| (ii) | කාලිදාස | B | රාජතරංගනී |
| (iii) | හර්ෂ | C | දශකුමාර චරිත |
| (iv) | කල්හාණ | D | රාමායනය |
| (v) | වාල්මිකී | E | ප්‍රියදර්ශිකා |

(1) CBEDA (2) CAEBD (3) CEDAB (4) CADEB (5) CBDEA (........)

(19) X | Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | කාංචිය | A | ගංගා |
| (ii) | බාරාණසී | B | කාවේරි |
| (iii) | භාරුකච්ච | C | යමුනා |
| (iv) | ඉන්ද්‍රප්‍රස්ථ | D | ගෝධාවරී |
| (v) | ප්‍රතිෂ්ඨාන | E | නර්මදා |

(1) ACBDE (2) CEABD (3) DCABE (4) EDBAC (5) BAECD (........)

(20)

| | X | | Y |
|---|---|---|---|
| (i) | කුල | A | බලකොටුවකි |
| (ii) | විෂ් | B | පැරණි ඉන්දීය කාසි වර්ගයකි. |
| (iii) | නිශ්ක | C | පවුල |
| (iv) | රාෂ්ට්‍ර | D | පාලන ඒකකයකි. |
| (v) | පූර් | E | විෂ්පති පාලනය කරයි. |

(1) CEBDA (2) CBDEA (3) CEDBA (4) CBEDA (5) CDEBA (........)

- **අංක 21 සිට 25 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(21) මොහෙන්ජෝදාරෝ නගරය පිහිටියේ කුමන ගංගාවක් අසලද?
(1) සින්දු (2) යමුනා (3) රවී
(4) බ්‍රහ්මපුත්‍ර (5) නර්මදා (........)

(22) සොළොස්මහා ජනපද අතරින් ප්‍රධානත්වය ගත් රාජ්‍යයේ පළමු රජතුමා කවුරුන්ද?
(1) කුජාල (2) අජාසත් (3) බිම්බිසාර
(4) බින්දුසාර (5) අශෝක (........)

(23) ඉන්දියාව වූ කලි ආරක්ෂිත රටකි. එහෙත් එරට අනාරක්ෂිත වීමට බලපෑ හේතුව වන්නේ,
(1) හිමාලය කඳුවැටිය (2) ගංගානම් ගඟ (3) ඛයිබර් දුර්ගය
(4) බැරෝඩා කපොල්ල (5) බ්‍රහ්ම පුත්‍ර නදිය (........)

(24) උතුරු ඉන්දියාව හා දකුණු ඉන්දියාව වෙන්කරනු ලබන්නේ,
(1) නර්මදා නදියෙනි. (2) ථාර් කාන්තාරයෙනි. (3) වින්ධ්‍යා කඳුවැටියෙනි.
(4) ඩෙකාන් සානුවෙනි. (5) බැරෝඩා කපොල්ලෙනි. (........)

(25) යුද්ධයට හා ධනයට අධිපති දෙවිවරුන් වන්නේ,
(1) ඉන්ද්‍ර හා කුවේර (2) ඉන්ද්‍ර හා යම (3) මරුත් හා ඉන්ද්‍ර
(4) ඉන්ද්‍ර හා වරුණ (5) මරුත් හා වරුණ (........)

- **අංක 26 සිට 30 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(26) හින්දුස්ථාන් තැනිතලාවේ නොහොත් ගංගා යමුනා තැනිතලාවේ බලපෑම
(1) මහා අධිරාජ්‍යය බිහිවීම. (2) සාරවත් පස කෘෂිකාර්මිකයට දායකවිය.
(3) ඛණිජ සම්පත් බහුල විය. (4) ගෘහ නිර්මාණ ශිල්පය හා සාහිත්‍ය වර්ධනය විය.

(5) මෙහි පළමු රජු අශෝක විය. (........)

(27) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිඳවැටීම පිළබඳව විවිධ මත,

(1) ජල ගැලීම (2) දේශගුණික වෙනස්වීම් (3) කැළෑ එළිපෙහෙලි වීම.

(4) මොහෙන්ජොදාරෝ හා හරප්පා නගර දෙකේ බලඅරගලය

(5) බාහිර ආක්‍රමණ (........)

(28) පශ්චාත් වෛදික යුගයේදී

(1) වර්ණක්‍රමය දැඩිව පැවතුණි.

(2) අධ්‍යාපනය බ්‍රාහ්මණ, ක්ෂේත්‍රිය හා වෛශ්‍යාන්ට පමණක් විය.

(3) වේද ශාස්ත්‍රය ඉගැන්වූයේ බ්‍රාහ්මණයන්ට හා වෛශ්‍යයන්ට පමණි.

(4) වෛදික යුගයට වඩා අඩු සැළකිල්ලක් කාන්තාවට හිමි විය.

(5) සතර ආශ්‍රම ධර්මයන්ට අනුව බමුණෝ ජීවත් විය. (........)

(29) මගධ රාජධානියේ නැගීමට හා වර්ධනයට හේතු වූයේ,

(1) මගධයේ භූගෝලීය පිහිටීම.

(2) දක්ෂ පාලකයන් හා දක්ෂ වූ සේනා සංවිධනය.

(3) කෘෂිකාර්මික හා වෙළඳ කටයුතුවල වර්ධනය

(4) සම්පත් බහුල වීම.

(5) අවට රාජ්‍යවලින් මගධයට ලැබුණු සහායෝගය. (........)

(30) පළමු කණිෂ්ක රජු,

(1) කුෂාණ රජුන් අතර ශ්‍රේෂ්ඨතම පාලකයාය.

(2) ඔහු බලයට පත් වූයේ ක්‍රි.ව. 78 දීය.

(3) මේ රජුගේ අගනුවර කනෞග්‍රජයයි.

(4) වීමා කැඩ්පයිසස් රජුගෙන් පසුව කනිෂ්ක රජ විය.

(5) මෙම වර්ෂය ශක රාජ වර්ෂ ක්‍රමයේ ආරම්භක වර්ෂයයි. (........)

- **අංක 31 සිට 35 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C හා D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

**A හා B පමණක් නිවැරදි නම් ............. (1) ද**

**B හා C පමණක් නිවැරදි නම් ............. (2) ද**

**C හා D පමණක් නිවැරදි නම් ............. (3) ද**

**A හා C පමණක් නිවැරදි නම් ............. (4) ද**

**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් පමණක් ............. (5) ද**

**වරහන් තුළ ලියන්න.**

| | | උපදෙස් සම්පිණ්ඩනය | | |
|---|---|---|---|---|
| (1)<br>**A සහ B පමණක් නිවැරදි ය.** | (2)<br>**B සහ C පමණක් නිවැරදි ය.** | (3)<br>**C සහ D පමණක් නිවැරදි ය.** | (4)<br>**A සහ C පමණක් නිවැරදි ය.** | (5)<br>**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය.** |

(31) ශුංගයෝ

(A) අන්තිම මෞර්ය රජු වූ බෘහද්රථ මරා ශුංග වංශික පළමු රජු පුෂමිත්‍ර සුංග රජවිය.

(B) ශුංගයෝ ක්ෂත්‍රිය වංශයට අයත් ය.

(C) ශුංගයන් විසින් ග්‍රීකයන් ඉන්දියාවට එන ගමන නවත්වන ලදී.

(D) ශුංග පාලන සමයේ අමරාවතී කැටයම් නිම කරන ලදී. (........)

(32) මෙගස්තීනිස්

(A) චන්ද්‍රගුප්ත මෞර්ය රාජ සභාවේ සිටි මසලියුකස් නිකේටර්ගේ තානාපතිවරයා වේ.

(B) ඉන්ඩිකා ග්‍රන්ථය ඔහු විසින් රචනා කරන ලදී.

(C) එහි අශෝක රජුගේ කාලිංග යුද්ධය පිළිබඳ කියවේ.

(D) අශෝක රජු සිහසුනට පත් වන විට මෙගස්තීනිස් රාජ සභාවේ විය. (........)

(33) ක්‍රි. පූ. හයවන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්වය.

(A) ජනපද අතරින් ජනපද හයක් ඉදිරියට පැමිණියහ.

(B) අවසාන ජයග්‍රහණය වජ්ජීන්ට හිමිවිය.

(C) ජනපද සොළොසක් තිබූ බව අංගුත්තර නිකායේ ද සඳහන් වේ.

(D) මෙම ජනපද සමූහාණ්ඩු හා රාජාණ්ඩු ලෙස පාලනය විය. (........)

(34) මෞර්ය රාජ්‍ය බිඳවැටීම.

(A) කාලිංග යුද්ධයෙන් පරාජය වීම.

(B) අවසාන අවධියේ දුර්වල පාලකයින් බලයට පත්වීම.

(C) විදේශීය ආක්‍රමණ හා දේශපාලන ඒකාබද්ධතාවය බිඳවැටීම.

(D) විදේශීය සබඳතාවල අයහපත් ප්‍රතිඵල (........)

(35) ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ අනුව,

(A) මහා කඳුවැටි ප්‍රධාන ගංගා නිසා වැදගත් වෙයි.

(B) ගෝදාවරී නදිය පැහැදිලි ස්වභාවික දේශසීමාවකි.

(C) ගංගා, යමුනා තැනිතලාව විශාල අධිරාජ්‍යවල මධ්‍යස්ථානයයි.

(D) බෝලාන් දුර්ගය ඉන්දියාවට පිවිසිය හැකි හොඳම මාර්ගයයි. (........)

- **අංක 36 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදිය. | නිවැරදිය. |
| (2) | නිවැරදිය. | වැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| (36) | ඉන්දියාවට සංක්‍රමණය වූ ශකයින් විදේශිකයින් හා ම්ලේච්ඡයින් ලෙස සලකනු ලැබේ. | ඔවුහු හින්දු කුස් තරණය කර බෝලාන් දුර්ගය හරහා ඉන්දුනිම්නයට ඇතුළු වී ඉන්දියාවට පැමිණියහ. | (........) |
| (37) | අර්ථ ශාස්ත්‍රය, චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ පුරෝහිත චානක්‍ය විසින් රචිත කෘතියකි. | අශෝක ශිලා ලිපි මෞර්ය අධිරාජ්‍යය අධ්‍යයනය කිරීමේ වැදගත් මූලාශ්‍රයකි. | (........) |
| (38) | නන්ද පරම්පරාවේ මහා පද්මානන්ද එම රාජවංශයේ අවසාන පාලකයා වේ. | පාහියන් ඉන්දියාවේ සංචාරය කළේ නරසිම්හ ගුප්ත රාජ්‍ය සමයේදීය. | (........) |
| (39) | ඍග් වෛදික ජනයා මුහුද දැන සිටි බවට සාධක නොමැත. | ඍග් වෛදික ජනයා සමුද්‍ර යනුවෙන් හැඳින්වූයේ මහා ජලාශයයි. | (........) |
| (40) | ස්කන්ධ ගුප්ත රජුගේ වැදගත්ම කාර්ය සංසිද්ධිය නම් හූනයන් පරාජය කිරීමය. | නමුත් හූන නායක තෝරමානට ස්කන්ධගුප්ත සටනේ දී පරාජය කිරීමට හැකි විය. | (........) |

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ඉන්දීය ඉතිහාසය - II

**12 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)**

---

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් වූ සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමැති දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

    (i) මොහෙන්ජෝදරෝ (ii) සුප්පාරක (iii) මහානදී
    (iv) ආරවල්ලි (v) කනෞජ් (vi) මක්රාන්

02. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සමාජ, ආර්ථික හා ආගමික තත්වයන් කෙටියෙන් සමාලෝචනය කරන්න.

03. භූගෝලීය සාධක පැරණි ඉන්දියාව ප්‍රධාන කොටස් තුනකට බෙදා වෙන් කළේය. පහත දී ඇති මාතෘකා යටතේ මේ කියමන සාකච්ඡා කරන්න.

    (i) වයඹදිග ඉන්දියාව (ii) හින්දුස්ථාන් තැනිතලාව
    (iii) අර්ධ ද්වීපික ඉන්දියාව

04. පහත දැක්වෙන මාතෘකා කෙරෙහි අවධානය යොමු කරමින් මගධයේ නැගීමට තුඩුදුන් සාධක සාකච්ඡා කරන්න.

    (i) බිම්බිසාර රජු හා අජාසත් රජුගේ යුද්ධ ව්‍යාපාර
    (ii) විවාහ සම්බන්ධතා
    (iii) භූගෝලීය හා ආර්ථික සාධක

05. (i) හරප්පා සභ්‍යත්වයේ ආගමික පිළිවෙත් සමාලෝචනය කරන්න.
    (ii) පශ්චාද් වෛදික යුගයේ ආගමික විශ්වාස පිළිබඳව සටහන් ලියන්න.


06. චන්ද්‍රගුප්ත මෞර්යය රජුගේ දේශපාලන කාර්යය සංසිද්ධිය පිළිබඳ විග්‍රහයක් කරන්න.

07. "පූර්ව මෞර්යය මගධ රාජ්‍යයේ නැගීම අනප්‍රාප්තික රාජවංශ කිහිපයක ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයකි." පරීක්ෂා කරන්න.

08. "මෞර්යය අධිරාජ්‍යයේ බිඳවැටීම බ්‍රාහ්මණ විරෝධයක ප්‍රතිඵලයක්යැයි පැවසීම කොතෙක් දුරට නිවැරදිද?

09. ඉන්දියාවට එල්ල වූ ඉන්දු ග්‍රීක, සක සහ කුෂාණයන්ගේ ආක්‍රමණ සැකෙවින් විස්තර කරන්න.

- අංක 01 ප්‍රශ්නය සඳහා අදාළ සිතියම.




e තක්සලාව The National e-learning Portal for The General Education